# තනතුරු ඇබෑර්තු

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### වෙරළ සංරක්‍ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වෙරළ සංරක්ෂණ පරීක්‍ෂක තනතුරේ පුරප්පාඩුව පිරවීම.

1. දැනට පුරප්පාඩුව පවතින වෙරළ සංරක්‍ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ, ප්‍රධාන වෙරළ සංරක්ෂණ පරීක්‍ෂක තනතුරු 01ක් පිරවීම සඳහා, මෙම නිවේදනයේ සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට, වෙරළ සංරක්‍ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වෙරළ සංරක්ෂණ පරීක්ෂක නිලධාරින් අතුරින් පහත සුදුසුකම් සම්පූර්ණ කරන සක්‍රිය සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. සපුරාලිය යුතු සුදුසුකම් :

I. පළපුරුද්ද

i. වෙරළ සංරක්ෂණ පරීක්ෂක තනතුරේ වසර 05 ක ස්ථිර, සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

II. වෙනත් සුදුසුකම් :

i. ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය.
ii. උසස් කිරීමේ දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු ය.
iii. III කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම. ( මෙය අදාළ වනුයේ වෙරළ සංරක්‍ෂණ නියාමක නව බඳවා ගැනීම් පටිපාටිය අනුව MN 01 සේවා ගණය යටතේ බඳවා ගත් නිලධාරීන් සඳහා පමණි.)
iv. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

3. තනතුර සඳහා තෝරාගනු ලබන ක්‍රමය :

රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සේවා පළපුරුද්ද හා කුසලතාවය සඳහා ලකුණු ලබා දෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අදාළ සෙසු අවශ්‍යතාවයන් ද සම්පූර්ණ කර ඇති බවට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කර තහවුරු කර ගැනීමෙන් අනතුරුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ කුසලතා අනුපිළිවෙල මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ දිනයේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදුකරනු ලබයි.

මෙම පුරප්පාඩුව සම්පූර්ණ කිරීමේ දී අයදුම්කරුවන් කිහිපදෙනෙකු සම ලකුණු ලබාගතහොත්, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019(II) ප්‍රකාරව එකී සම ලකුණු ලබාගත් අයදුම්කරුවන්ට පමණක් සීමාවූ අමතර කුසලතා-පාදක සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරාගැනීම සිදුකරනු ලැබේ. ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ඇගයීම් නිර්ණායක හා ලකුණු පරිමාණයක් උපයෝගි කර ගනු ලැබේ. අදාළ අයදුම්කරුවන්ට මෙම ඇගයීම් නිර්ණායක හා ලකුණු පරිමාණය පිළිබඳව එම අවස්ථාවේ දී පූර්ව දැනුවත් කිරීමක් සිදුකරනු ලැබේ.

i. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබාදීමේ පරිපාටිය

| *අනු අංකය* | *ක්ෂේත්‍රය* | *උපරිම ලකුණු* |
|---|---|---|
| 01 | **අධ්‍යාපන සුදුසුකම් -**<br>➢ ක්ෂේත්‍රයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලැබූ හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 A වගන්තිය යටතේ පිළිගත්,<br>❖ පශ්චාත් උපාධියක් සඳහා ලකුණු 20<br>❖ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සඳහා ලකුණු 15<br>*සැ.යු.* - ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | 20 |

| අනු අංකය | ක්ෂේත්‍රය | උපරිම ලකුණු |
|---|---|---|
| 02 | **වෘත්තීය සුදුසුකම් -**<br><br>➢ ක්ෂේත්‍රයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්,<br><br>❖ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා ලකුණු 20<br>(කාලය අවුරුදු 1 කට වැඩි)<br>❖ මාස 6 කට වැඩි සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා ලකුණු 15<br>❖ මාස 6ත් මාස 3 අතර සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා ලකුණු 10<br><br>**සැ.යු.** - ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | 20 |
| 03 | **අමතර පළපුරුද්ද -**<br><br>වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වෙරළ සංරක්ෂණ පරික්ෂක තනතුරෙහි වසර 05 ක ස්ථිර, සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව එළඹෙන අමතර සක්‍රීය සේවා කාලය සඳහා පහත ආකාරයට ලකුණු දෙනු ලැබේ. වැඩිම අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියාට අමතර පළපුරුද්ද සඳහා වෙන් කර ඇති ඉහළම ලකුණු ප්‍රමාණය ලබා දෙන අතර සෙසු නිලධාරීන්ට පහත ආකාරයට ලකුණු දෙනු ලැබේ.<br><br>අමතර පළපුරුද්ද සඳහා වෙන් කර ඇති උපරිම ලකුණ<br>―――――――――――――――<br>වැඩිම අමතර සක්‍රිය හා සතුටුදායක සේවාකාලයක් සහිත නිලධාරියාගේ සේවා කාලය (අවුරුදු x12 + මාස)<br><br>x අදාළ නිලධාරියාගේ අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලය (අවුරුදු x12 + මාස) | 30 |
| 04 | **ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය -**<br><br>❖ අයදුම්කරු තමන් ලබා ඇති පශ්චාත් උපාධිය/ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව/ මූලික උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා තිබීම. ලකුණු 15<br><br>❖ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අධ්‍යාපන ආයතනයකින් හදාරන ලද ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා. (කාලය අවුරුදු 1 කට වැඩි) ලකුණු 10<br><br>❖ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අධ්‍යාපන ආයතනයකින් හදාරන ලද ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මාස 06කට නොඅඩු සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා. ලකුණු 05<br><br>**සැ.යු.** - ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ. | 15 |

| අනු අංකය | ක්ෂේත්‍රය | උපරිම ලකුණු |
|---|---|---|
| 05 | **පරිගණක හැකියාව -**<br><br>➢ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක පරිගණක විද්‍යාව පිළිබඳව<br><br>❖ එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා. ලකුණු 10<br>❖ සය මාසික ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා. ලකුණු 07<br>❖ සය මසකට අඩු සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා ලකුණු 05<br><br>**සැ.යු.** - ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | 10 |
| 06 | **සම්මුඛ පරීක්ෂණය -**<br><br>➢ පෞරුෂත්වය ලකුණු 02<br>➢ නායකත්වය ලකුණු 02<br>➢ සන්නිවේදන හැකියාව ලකුණු 01 | 05 |
| **එකතුව** | | 100 |

***සැ.යු. -*** සහතික පත්‍ර හා ලියවිලි මගින් සම්මුඛ පරීක්ෂණයේ දී සනාථ කරනු ලබන සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. බඳවා ගැනීමේ දී මූලික සුදුසුකමක් ලෙස උපාධිය සලකා ඇති බැවින් සම්මුඛ පරීක්ෂණයේ දී ඒ සඳහා ලකුණු ලබා නොදේ.

4. මෙම තනතුර සඳහා අදාළ වැටුප් ක්‍රමය :

රා.පරි.ච. 10/2025 අනුව MN 7 – 2025 වැටුප් කාණ්ඩයේ, මාසික වැටුප් පරිමාණය :

රු.71,240 – 11X1,360 – 18 X 1,850 - රු. 119,500/- කි.

5. අයදුම්පත් යොමු කිරීම.

පහත සඳහන් ආදර්ශ අයදුම්පතට අනුව සකස් කරන ලද අයදුම්පත්, අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වන **2026.01.26** දිනට **හෝ ඊට පෙර** අයදුම්කරුවන් විසින් තම, අංශ ප්‍රධානී මගින් අධ්‍යක්ෂ ජනරාල්, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, තැ.පෙ.556, නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුයි. කවරයේ වම්පස උඩ කෙලවරේ "වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වෙරළ සංරක්ෂණ පරීක්ෂක තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහාවන සම්මුඛ පරීක්ෂණය" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු යි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ලේකම්,
පරිසර අමාත්‍යාංශය.

2025 දෙසැම්බර් මස 26 දින.